# අනගාරික ධර්මපාලතුමාගේ ජාත්‍යන්තර කාර්යභාරය

**ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති

දොන් ඩේවිඩ් හේවාවිතාරණ දරුවා උපදින්නේ ම බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට සිරිලක යටත්ව පැවති සමයේ ය. එනම් 1864 වසරේ සැප්තැම්බර් 17 වන දාය. කුඩා අවධියෙහි පාසල තුළ ඔහු හට අකුරු කරන්නට සිදුවූයේ විදේශික ගුරුවරුන් ඇසුරේය. වැඩිපුර ඉගෙන ගත්තේ ඉංග්‍රීසි භාෂාවෙනි. පූජ්‍ය මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් විසින් පැවැත්වූ පානදුරාවාදයේ යශෝරාවය කරණ කොට ගෙන මෙරටට පැමිණි හෙන්රි ස්ටීල් ඕල්කොට් හා එච්. පී. බ්ලැවැට්ස්කි සුධීමතුන්ගේ ආශ්‍රය, ඕල්කොට් තුමාගේ දේශනා ක්ෂණිකව සිංහලයට පරිවර්තනය කිරීම, පරම විඥාර්ථ සමාගමේ ක්‍රියාකාරකම්, හේවාවිතාරණ තරුණයාට බලපෑවේ විශේෂ වශයෙනි. ඒ වන විට ඔහු 14 වැනි වියේ පසු වූ නව යෞවනයෙකි. හේවාවිතාරණ දෙගුරුන් ද ඕල්කොට් තුමා මෙන් ම පූජ්‍ය හික්කඩුවේ සුමංගල නාහිමියන් පවා අකමැති වූ ඉන්දියාවේ අඩයාර් ගමන හේවාවිතාරණ තරුණයාගේ දිවියෙහි කඩ ඉමක් වූයේ ය. 1884 වසරේ දී බ්ලැවැට්ස්කි මැතිණිය සැමට කරුණු කියා අස් වසා, හේවාවිතාරණ තරුණයාට ඉන්දියාවට යාමට අවස්ථාව ලබා දුන්නීය. ඕල්කොට් තුමාත් ෆ්‍රාන්ස් හාට්මන් වෛද්‍යතුමාත් එම පිරිස රැගෙන යාමට මදුරාසියේ සිට මෙහි පැමිණියහ. බ්ලැවැට්ස්කි මැතිණියට අමතරව ලන්ඩන් වල සිට පැමිණි ඩික්ලි කූපර් යුවල හා සී. ඩබ්ලිව්. ලෙඩ්බීටර් පූජක තුමා ද එම කණ්ඩායමට ඇතුළත් වූහ. 1886 වසරේදී ඕල්කොට් තුමා සහ ලෙඩ්බීටර් ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් ඇති කිරීමේ අරමුදලට සක්‍රීයව දායක වූහ.

ධර්මපාලතුමාගේ මුල්ම වන්දනාව සිදුවූයේ 1891 වසරේ ජනවාරි 02 දින ය. ඒ ඉසිපතන හෙවත් සාරානාත් - බරණැස් නුවරටත්, බුද්ධගයාවටත්ය. ධර්මපාලතුමන්ගේ සකල විධ ආකල්ප ධාරාව වෙනස් වීමට බුද්ධගයා ගමන හේතු වූයේ ය. එතුමා 1891 වසරේ මාර්තු මස බුද්ධගයාවේ සිට කල්කටා නුවරට පිටත් වී ගියේ ය. කල්කටාවේ ධර්මපාල තුමාට නීල් කොමුර් මුඛර්ජි හමුවීම තවත් අන්තර්ජාතික සබඳතා තහවුරු වීමක් විය. 1891 වසරේ මාර්තු මස රැන්ගුන් නගරයට පැමිණිය ද ධර්මපාලතුමා හට නවාතැන් පහසුකම් නොතිබුණි. සපත්තුකරුවකු සමඟ සිටින විට බුරුම ජාතිකයන් විසින් ධර්මපාලතුමන්ව හඳුනාගෙන, ඔහුව හොජෝ හිමි වෙත රැගෙන යන ලදි. එහිදී හෙතෙම මාස දෙකක් පමණ ආගන්තුක සත්කාර ලබමින් එහි ජීවත් වූයේ මහත් සැදැහැ ගුණයෙන් යුතුවය.

1891 වසරේ මැයි මස මහාබෝධි සංගමය පිහිටුවීමෙන් ධර්මපාල තුමා තවත් පියවරක් ඉදිරියට ගියේ බුදු සසුන සුරැකීමට අදිටන් කර ගනිමිනි. රාමඤ්ඤ නිකායේ භික්ෂූන්

වහන්සේ ධර්මපාල තුමන් විසින් බුද්ධගයාව වෙත වැඩම කරවන ලද්දේ 1891 වසරේ ජූලි මාසයේ ය. ඔහු සිය ප්‍රථම ඉංග්‍රීසි දේශනය කල්කටාවේ ඇල්බට් ශාලාවේදී පවත්වන ලද්දේ 1891 වසරේ ඔක්තෝබර් මාසයේදී ය. ඒ බෞද්ධ සහ හින්දු ආගම් අතර අන්තර් සම්බන්ධය විමසමිනි. ඔහු නීල් කොමුල් මුඛර්ජි මහතාගේ නිවසේ නතරවන ලද අතර, ඔහු ද ධර්මපාල තුමාගේ දායකයෙක් බවට පත් වූයේ ය. ඉන්දියන් මිරර් පුවත්පතේ කතුවරයා සමඟ මිත්‍රත්වය ඇති වීම ප්‍රයෝජනවත් වූයේ ඔහුගේ ලේඛන කටයුතුවලටය. මහාබෝධි සඟරාව 1892 දී පටන්ගත් ධර්මපාලතුමා එම සඟරාවේ සාරගර්භ බෞද්ධ රචනා පළ කළේය. එම ලිපි ප්‍රසිද්ධ විය. එතුමාට චිකාගෝ නුවර පැවැත්වූ ජගත් ආගමික සමුළුවට ආරාධනා ලැබුණේ මේ පාණ්ඩිත්‍යය කරණ කොට ගෙනය. 1892 වසරේ ඔක්තෝම්බර් මස අඩියාර් වෙත නැවත පැමිණි එතුමා එහි ජනතාව සමඟ එකතුව ඉන්දියාවේ මහාබෝධි සංගමය පිහිටුවමින් තවත් මඟකට පිවිසියේ ය. 1893 යළිදු බුරුමයේ රැන්ගුන් නුවර බලා පිටත් වූ අතර, 1893 වසරේ ජූලි මස ලෝක ආගමික සමුළුව ඇමතීමට ලන්ඩන් ඔස්සේ ඇමරිකාව බලා ගමන් කළේය.

1893 වසරේ අගෝස්තු මස ලන්ඩනයේ දී 'ආසියාවේ ආලෝකය' පොත ලියූ ශ්‍රීමත් එඩ්වින් ආර්නෝල්ඩ් තුමා හමුවී එතුමාගේ මිත්‍රයකු බවට පත් විය. ඇනී බ්ලැසන්ට් මැතිණිය සමඟ ඇමරිකාව බලා පිටත් වී ගියේ ය. 1893 වසරේ සැප්තැම්බර් මස ධර්මපාල තුමා දකුණු දිග බුදු දහම සම්බන්ධව ලෝක පූජිත වූ දේශනය ජගත් ආගමික සමුළුවේදී පැවැත්වීම ඓතිහාසික සිද්ධියක් වූයේය. 1893 වසරේ නොවැම්බර් මස ධර්මපාලතුමා ජපානයට ගියේය. 1894 වසරේ ජනවාරි මස චීනයේ ෂැංහයි නගරයට ගිය අතර, එහි සුපතළ විහාරයකදී දේශනයක් පැවැත්වීය. 1894 වසරේ පෙබරවාරි මස එතුමා සියම් දේශයේ බැංකොක් නුවරට ගියේය. රාජකීය කුමාරයාගේ ආරාධනයෙන් එහි මහාබෝධි ශාඛාවක් පිහිටුවීය. 1894 වසරේ අප්‍රේල් මස එතුමා නැවත කොළඹට පැමිණියේය. 1894 වසරේ දෙසැම්බර් මස බුද්ධගයා වන්දනාව සඳහා ශ්‍රී ලාංකිකයන් සමඟ එක් විය. 1896 වසරේ මැයි මස ප්‍රථම වෙසක් මංගල්‍යය කල්කටාවේදී පැවැත්වීය. ඉන්දියාව, බුරුමය, චීනය, ඇමරිකාව, ලන්ඩනය, පිලිපීනය, ජර්මනිය වැනි රට රටවල බුදු සසුනේ ව්‍යාප්තිය ඇති කිරීමට නූතන යුගයේ ප්‍රබල හේතුවක් බවට පත් වූයේ ධර්මපාල තුමන් විසින් ඉටු කරන ලද ඓතිහාසික කාර්යභාරයයි.